# ඇබෑර්තු

# සීමාසහිත ලංකා

# ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව

LANKA BMC

## ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවෙහි පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### තනතුර : 01. කළමනාකරු - අභ්‍යන්තර විගණක (කොන්ත්‍රාත් පදනමින්)

**සුදුසුකම් :**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණ / මූල්‍ය කළමනාකරණ / වාණිජ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

හෝ

පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අන්තර්මධ්‍ය විභාගය සමත්ව තිබීම

සමග

සුදුසුකම් ලැබීමෙන් පසුව තනතුරට අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්ද.

අයදුම්කරු, අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානි වශයෙන් කටයුතු කරනු ලබන අතර, අභ්‍යන්තර සියලු විගණන කරුණු සම්බන්ධයෙන් සභාපතිවරයාහට වගකිව යුතුවේ. එසේම, මූල්‍ය මෙහෙයුම්වල අභ්‍යන්තර පාලන පද්ධතියෙහි සහභාගීත්වය දැරීම, අඛණ්ඩව, මූල්‍ය මෙහෙයුම් පිළිබඳව ස්වාධීන තක්සේරු කිරීමක් සිදුකිරීම, අභ්‍යන්තර පරීක්ෂණවල ප්‍රමාණාත්මකභාවයේ ස්ථාවරත්වය, දෝෂ අනාවරණය, වංචා හා ගිණුම්කරණ ඌණතා අනාවරණය, දෝෂ නිවැරදි කිරීමට සහයවීම හා නිවාරණ පියවර ගැනීම, විශේෂ විමර්ශණ, විනය සම්බන්ධ කරුණුවලට ආශ්‍රිත ප්‍රාථමික විමර්ශණ පැවැත්වීම යන කාර්ය අයත්වේ. සභාපතිවරයාහට වාර්තා ඉදිරිපත් කිරීම, වාර්තා පවත්වා ගැනීම, වාර්තා සකස් කිරීම, තමන් යටතේ කටයුතු කරනු ලබන කාර්ය මණ්ඩලයට දිශානති මාර්ගෝපදේශ ලබාදීම සහ අනෙකුත් ක්‍රියාකාරීත්වයට පහසුකම් සලසනු ලබන වගකීම් අයත්වේ.

**කොන්ත්‍රාත් වැටුප :** (සියලු දීමනා සහිතව රුපියල් 60,975/= වේ.

**වයස :**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය.

### 02. මධ්‍යම කළමනාකරු - නීති නිලධාරී (කොන්ත්‍රාත් පදනමින්)

**සුදුසුකම් :**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය පිළිබඳ ප්‍රථම උපාධියක් (LLB),

සමග

නීතිඥයකු වීම

සහ

උපාධිය ලබාගැනීමෙන් පසුව තනතුරට අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර එකක (01) රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක පළපුරුද්ද.

අදාළ තනතුරට ආයතනයේ ඇතුළත සියලුම නෛතික කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම දරන අතර, අභ්‍යන්තර හා බාහිර නෛතික ගැටළු හසුරුවීම හා ආයතනය නෛතික ආරවුල්වලින් තොරව පවත්වාගෙන යාම සඳහා හැකි සෑම පියවරයන් ගැනීමද අයත් වේ.

- නීති උපදේශ ලබාදීම හා නෛතික ගැටලුවලදී සහායවීම හා උපදේශකත්වය ලබාදීම.
- නෛතික ලේඛන සකස් කිරීම හා ආයතනය වෙනුවෙන් අධිකරණවල පෙනී සිටීම.
- සියලුම නෛතික කාර්ය හසුරුවීම.

**කොන්ත්‍රාත් වැටුප :** රුපියල් 60,975/- (MM 1-1) (සියලු දීමනා ඇතුළත්ව)

**වයස :**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය.

**පොදු කොන්දේසි :**

01. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
02. රාජ්‍ය අංශයේ අයදුම්කරුවන්, තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානි මාර්ගයෙන් යොමුකළ යුතු වේ.
03. ජීවදත්ත හා සහතිකවල පිටපත් සමග ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනකුගේ නම් හා ඇමතුම් අංක ඇතුළත් අයදුම්පත් 2021 ජූලි 30 වන දිනට ප්‍රථම ලැබීමට සැලැස්විය යුතුය.
04. බඳවා ගැනීම සිදුකිරීමෙන් පසුව, ප්‍රධාන පුද්ගල දර්ශකය තුළින් (KPI) කාර්යසාධනය මැන බලනු ඇත.
05. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. රජයේ ආයතනවල / අර්ධ රාජ්‍ය සේවයේ අයදුම්කරුවන්, තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානි මාර්ගයෙන් යොමුකළ යුතුවේ. අදාළ අවසන් දිනයට හෝ තම අයදුම්පත ආයතනය වෙත ලැබීමට සැලැස්වීම අයදුම්කරුගේ වගකීම වේ.

**සභාපති,**

**සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව, අංක 541, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.**

**දුරකථනය : 2326701/02**

Source: Dinamina, Daily News (2021.07.09)